# භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

## පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය

# ඇබෑර්තු

1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත මගින් ස්ථාපිත භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. අධ්‍යක්ෂ (මානව සම්පත්) HM 1 - 2 - තනතුරු 01**

**02. අධ්‍යක්ෂ (මූල්‍ය) HM 1 - 2 - තනතුරු 01**

**03. අධ්‍යක්ෂ (නීති) HM 1 - 2 - තනතුරු 01**

### 01. අධ්‍යක්ෂ (මානව සම්පත්)

**බාහිර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)**

**අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් :**

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් මානව සම්පත් / කළමනාකරණ / රාජ්‍ය පරිපාලන (01 හෝ 02 පන්තිය) (විශේෂ) උපාධියක් ලබා තිබීම

සහ

(2) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත්, මානව සම්පත් / කළමනාකරණ / පරිපාලන ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් (මාස්ටර්ස්) උපාධියක් ලබා තිබීම

**සේවා පළපුරුද්ද :**

(3) මානව සම්පත් / පරිපාලන ක්ෂේත්‍රයට අදාළව "කළමනාකරණ තලයේ", රජයේ සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක / පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර දහතුනක (13) පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

**අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් :**

(1) ඉහත (1 හා 2) හි සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් ලබා තිබීම.

**සේවා පළපුරුද්ද :**

(2) තනතුරට අදාළව මානව සම්පත් / පරිපාලන ක්ෂේත්‍රයේ "කළමණාකරන මට්ටමේ" (MM 1-1) 1 ශ්‍රේණිය තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

### 02. අධ්‍යක්ෂ (මූල්‍ය)

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හා 2 හෝ 3)**

**අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :**

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් ගණකාධිකරණ / වාණිජ්‍ය (විශේෂ) උපාධියක් ලබා තිබීම.

(2) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් ගිණුම්කරණ / මූල්‍ය ක්ෂේත්‍රයන්ට අදාළ පශ්චාත් (මාස්ටර්ස්) උපාධියක් ලබා තිබීම.

(3) තනතුරට අදාළව ගිණුම්කරණ / මූල්‍ය ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

සහ

**සේවා පළපුරුද්ද**

ගිණුම්කරණ / මූල්‍ය ක්ෂේත්‍රයට අදාළව රජයේ සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක / ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක "කළමනාකරණ තලයේ" අවම වශයෙන් වසර දහතුනක (13) පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)**

**අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :**

(1) ඉහත (1 හා 2 හෝ 3) හි සඳහන් බාහිර අයදුම්කරුවන්හට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

**සේවා පළපුරුද්ද :**

(2) තනතුරට අදාළව ගිණුම්කරණ / මූල්‍ය ක්ෂේත්‍රයේ "කළමණාකරන මට්ටමේ" (MM 1-1) 1 ශ්‍රේණිය තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

### 03. අධ්‍යක්ෂ (නීති)

**බාහිර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)**

**අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් :**

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් නීති (LLB) උපාධියක් සහ නීතිඥවරයෙකු වීම.

සමග

නීති ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් (මාස්ටර්ස්) උපාධි සුදුසුකම් ලබා තිබීම

සමග

තනතුරට අදාළව, නීති කටයුතු ක්ෂේත්‍රයේ හෝ සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක ක්‍රියාකාරී පරිචයක් සහිතව අවම වශයෙන් වසර දහතුනක (13) පළපුරුද්ද

(2) නීති ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම් සහිත නීතිඥවරයකු වීම,

සහ

තනතුරට අදාළව සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක නීති ක්ෂේත්‍රයේ හෝ ක්‍රියාකාරී පරිචයන් සහිත අවම වශයෙන් වසර දහතුනක (13) පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත 1 හෝ 2)**

**අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්**

(1) ඉහත බාහිර අයදුම්කරුවන්ගේ අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

**සේවා පළපුරුද්ද :**

(2) තනතුරට අදාළව නීති කාර්ය ක්ෂේත්‍රයේ "කළමනාකරණ මට්ටමේ" (MM 1-1) 1 ශ්‍රේණිය තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම හා නීතිඥවරයකු ලෙස දිව්රුම් දී තිබීම.

වැටුප් පරිමාණය, අංක 02 / 2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාර වේ.

HM 1-2 රුපියල් 81,670 - 15 x 2,270 - 115,720 + ජීවන වියදම් දීමනාව

වෘත්තීය දීමනාව : (අංක 5/2017 MSD චක්‍රලේඛය ප්‍රකාරව වේ)

**වයස් සීමාව :**

වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයන්හට මෙම වයස් සීමාව අදාළ නොවේ.

**තනතුරුවලට අදාළ පොදු කොන්දේසි :**

- තෝරාගත් අයදුම්කරුවන් විසින්, තම වැටුපෙන් 10% ප්‍රමාණයක් සේවක අර්ථ සාධක අරමුදලට (EPF) දායක විය යුතු අතර, කාර්යාංශය විසින් 15% ප්‍රමාණයකින් දායක වනු ඇත. තවද, කාර්යාංශය විසින් 3% ක ප්‍රමාණයකින් සේවක භාර අරමුදලට (ETF) දායකත්වයක් ලබා දෙනු ඇත.
- පවත්නා පොදු ව්‍යවසාය චක්‍රලේඛය අංක 1/2015 නියමයන් ප්‍රකාරව අනුමත කළ ඉන්ධන දීමනාව සහිත වෙන්කළ වාහනයක් හෝ ප්‍රවාහන දීමනාවක් ලබා දේ.
- රෝහල් වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා හිමිකම ලැබේ.
- බාහිර රෝගී වෛද්‍ය ලදුපත් සඳහා මුදල් ප්‍රතිපූරණය කෙරේ.
- රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අපේක්ෂකයන්, තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුය.
- අයදුම්කරුගේ තොරතුරු විමසා බැලීම සඳහා ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක තම අයදුම්පතෙහි සඳහන් කළ යුතුය.
- අධ්‍යාපනික හා අනෙකුත් අදාළ සහතිකවල ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා තිබිය යුතුය.

අයදුම් කරනු ලබන තනතුර, අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු අතර, ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත, 2020.08.09 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ඇත.

**සභාපති,**
**භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය,**
**අංක 569, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ.**